# 4 ශ්‍රේණිය සිංහල
# ගුරු අත් පොතට
# වැඩ පොත - අංක 13

Part x

## L10, S10, R10, W10

## නිපුණතා ආවරණය - 2021



- ලිඛිත භාෂාවෙන් ලියවුණු ලේඛන කියවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- වර්තමාන හා අතීත කාල වාක්‍යවල යෙදීම පැහැදිලි කරයි.
- ලිඛිත ව්‍යවහාරය පිළිබඳ අවබෝධයෙන් යුතු ව, නිවැරදි ව භාෂා අභ්‍යාසයේ යෙදෙයි.
- ලේඛන ව්‍යවහාරයට අනුව ලිවීමේ කුසලතාව වර්ධනය කර ගනියි.
- අක්ෂර වින්‍යාසයේ නිවැරදි භාවිතය වර්ධනය කර ගනියි.

සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# "ඌ" යෙදුණු අතීත කාල වාක්‍ය

- සතුන් සඳහා යෙදෙන ප්‍රාණවාචී ඒකවචන උක්ත පදයක් කිහිප වරක් යෙදෙන අවස්ථාවල දී එම නාම පදය වෙනුවට "ඌ" යන පදය භාවිත වේ. ඒ සමඟ යෙදෙන ක්‍රියා පදය "ඒය" ලෙස අවසන් වේ. පහත සඳහන් එක් එක් වාක්‍යවල "ඌ" යන ඒකවචන උක්ත පදය සහ එයට අදාල අතීත කාල ක්‍රියා පදය යටින් ඉරක් අඳින්න.

1. ඌ සෙල්ලම් කරයි.
   ඌ සෙල්ලම් කළේ ය.
2. ඌ තණකොළ කයි.
   ඌ තණකොළ කෑවේ ය
3. ඌ මවගෙන් කිරි බොයි.
   ඌ මවගෙන් කිරි බිව්වේ ය.
4. ඌ අඹ ගසේ සිටියි.
   ඌ අඹගසේ සිටියේ ය.
5. ඌ ඉහළ අහසේ පියාඹයි.
   ඌ ඉහළ අහසේ පියැඹුවේ ය.

.

- පහත ඡේදයේ "ඌ" උක්තය ලෙස යෙදී ඇති අතීත කාල වාක්‍ය උපුටා ලියන්න.

<u>ගිරවා</u>

අපේ නිවසේ අඹ ගසට සැම දිනක ම පැමිණි ගිරවා අලංකාර ය. ඌ ඉදුණු අඹ කෑවේ ය. අඹ අවාරයට ද ගිරවා අඹ ගසට පැමිණ සුළු මොහොතක් සිටියි. ඌ ජම්බු, රඹුටන් ආදි පලතුරු කෑවේය. විටෙක ඌ වී කරල් ද රැගෙන අඹ ගසට ආවේ ය. ටික දිනක් යන විට ගිරවා අඹ ගසේ ඇති බෙනයක තම නිවහන තැනීම ආරම්භ කළේ ය. ඌ ඒ සඳහා දවසේ බොහෝ වේලාවක් ගත කළේ ය. ටික දිනක් යන විට ඌ තම නිවහන තනා නිම කළේ ය.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

<u>හාවා</u>

අපේ ගෙදර මිදුලේ උදුපියලිය වවා තිබුණි. දිනක් හාවෙක් උදුපියලිය බිමට ආවේ ය. ඌ උදුපියලිය කෑවේ ය. අනතුරු ව ඌ උදුපියලිය බිමේ පිනුම් ගැසුවේ ය. ඌ දිග කන් ඔසවා වටපිට බැලුවේ ය. හාවා නැවතත් උදුපියලිය කෑවේ ය. නැවතත් ඌ වටපිට බැලුවේ ය. ඌ සැම විට ම අවට පිළිබඳ විමසිලිමත් වූවේ ය.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

# මගේ සුරතල් වසු පැටියා

හඳයා යනු මගේ සුරතල් වසු පැටියාගේ නම යි. ඌගේ නළලේ ලපයක් ඇති නිසා ඌට ඒ නම බොහෝ ගැලපෙයි. ඌ ඉපදුණු දින ම නැඟිට්ටේ ය. වසු පැටියා ඉපදෙන තෙක් අප සිටියේ නොඉවසිල්ලෙනි. ඌ වත්ත වටේ දිවුවේ ය. ඌ දුව පැන සෙල්ලම් කළේ ය. වසුපැටියා කිරි බීමට කැමැත්තක් දැක්වීය. එහෙත් ඌ ලපටි තණකොළ කෑවේය. වසුපැටියා ලොකු වූ විට ඌගේ පිට උඩ නැඟ ගම වටේ යෑම අපගේ එක ම අරමුණ විය.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

- වර්තමාන කාල වාක්‍ය සහ අතීත කාල වාක්‍ය වෙන් කර ලියන්න.

1. ඌ කුඹුර අසල සිටියි.
2. ඌ කුඹුර අසල සිටියේ ය.
3. ඌ උඳුපියලිය කයි.
4. ඌ උඳුපියලිය කෑවේ ය.
5. ඌ පැන් උගුරක් බොයි.
6. ඌ පැන් උගුරක් බිවුවේ ය.
7. ඌ සෙල්ලම් කරයි.
8. ඌ සෙල්ලම් කළේ ය.
9. ඌ ගඟේ දිය නායි.
10. ඌ ගඟේ දිය නෑවේ ය.
11. ඌ කුඹුරේ දුවයි.
12. ඌ කුඹුරේ දිවුවේ ය.
13. ඌ පැන පැන යයි.
14. ඌ ඉදුණු පලතුරු දෙස බැලුවේ ය.
15. ඌ ගඟෙන් වතුර බොයි.
16. ඌ ඉහළ අහසේ පියඹා ගියේ ය.
17. ඌ ගස්වල දළු කෑවේ ය.
18. ඌ ගඟ දෙස බලයි.
19. ඌ සතුටින් පැන පැන ගියේ ය.
20. ඌ කැලය දෙසට ඇදෙයි.
21. ඌ ගම වටේ දිවුවේ ය.
22. ඌ රඹුටන් ගසේ සිටියි

❖ වර්තමාන කාල වාක්‍ය

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

❖ අතීත කාල වාක්‍ය

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

- පහත දී ඇති වර්තමාන කාල වාක්‍ය අතීත කාලයෙන් ලියන්න.

   1. ඌ ඉදුණු පලතුරු කයි.

   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

   2. ඌ මවගෙන් කිරි බොයි.

   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

   3. ඌ වටපිටාව දෙස විමසිලිමත් වෙයි.

   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. ඌ කැලයට පැන පැන යයි.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. ඌ ගසේ අත්තක කුඩුවක් සාදයි.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

- පළමු වාක්‍ය කියවා ඊට ගැළපෙන දෙවන වාක්‍ය වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.

1. 1. හාවා කැරට් අලය දෙස ආශාවෙන් බැලුවේ ය.

   2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. 1. ඇතා කැලයේ ඔබමොබ සැරිසැරුවේ ය.

   2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. 1. සිංහයා ගල් ගුහාවේ සිට එළියට ආවේ ය.

   2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. 1. සමනලයා උදෑසන ම මල් වත්තට පැමිණියේ ය.

   2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. 1. කොකා වෙල අද්දර සිටගෙන සිටියේ ය.

   2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(ඌ සිංහ ධේනුව සහ පැටියා සිටින අයුරු දුටුවේ ය./ ඌ කැරට් අලය කෑමට පටන් ගත්තේ ය./ ඌ මලින් මලට ගොස් මල් පැණි බිවුවේ ය./ ඌ විමසිල්ලෙන් යුතු ව වටපිට බැලුවේ ය./ ඌ වක්කඩ ළඟ සිටින තිත්ත පැටවුන් දුටුවේ ය.)

- පළමු වාක්‍ය තුන කියවා එම රටාව අවබෝධ කරගෙන දී ඇති හිස්තැනෙහි "ඌ" යොදා නිදහසේ වෙනත් වාක්‍ය ගොඩනගා ලියන්න.

<u>සමනලයා</u>

සමනලයා ලස්සන සතෙකි.
ඌ උදෑසනින් ම මල් වත්තක් සොයා පියාඹුවේ ය.
ඌ මල් වත්තකට ගොස් මල් පැණි බිවුවේ ය.

<u>මී මැස්සා</u>

මී මැස්සා කඩිසර සතෙකි.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

<u>ඇතා</u>

ඇතා විශාල සතෙකි.
ඌ කොළ අතු ආහාරයට ගත්තේ ය.
ඌ තම ශරීර ශක්තිය පෙන්වමින් විශාල කොටන් ඇද්දේ ය.

<u>ජිරාෆ්</u>

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

## කොහා

කොහා අවුරුදු කාලයට දක්නට ලැබුණු පක්ෂියෙකි.
ඌ උදෑසනින් ම අවදි වූවේ ය.
ඌ මිහිරි හඬින් නාද කළේය.

## ගිරවා

ගිරවා අලංකාර පක්ෂියෙකි.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

## පුනරීක්ෂණ

- ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු දී ඇති තිත් ඉරි මත ලියන්න.

කැලයේ අප සිත් ගත් එක තැනක් වූයේ දිග ඇල්ල යි. කන්ද මැද්දේ රත්තණ පඳුරක් අස්සෙන් මතුවන පුංචි දිය කඳුරක් වේගයෙන් පහළට ගලා බසියි. වතුර ගලන්නේත් පහත් තැනකට යයි පෙන්වන ලෙසින් තවත් දිය කඳුරු කීපයක් ඊට ම එක්වෙයි. එහෙයින් ටික දුරක් යන්නට පෙර සැදෙන දිය කඳක් ගලා බසියි. මේ දිය කඳ එක් තැනක දී ගල් තලාවකින් පහළට ඇද හැලී අපූරු දිය ඇල්ලක් මවයි. ලොකු කුඩා ගල් පර්වත රුසක හැපෙන දිය කඳ සුදු පැහැයෙන් රැරා ගොස් ඇළක් බවට පත් වී කැලෑවේ නොපෙනී යයි. මේ ඇළ නැවත මතුවන්නේ ගම මැදින් ගලා බසිමිනි.

දිය ඇල්ලේ සෝභාව කැලෑවේ ටික දුරක් පැතිරෙයි. ගල් තලා දෙපස ඕකිඩ්, වෙසක් ආදි මල් ද, කුඩා හැඩයා, ලොකු හැඩයා ආදි පැළෑටි ද වැවී ඇත. කිසිවකු අතින් සාත්තු නො ලබන මල් පඳුරු විස්තර කළ නො හැකි අලංකාර මල් හට ගන්වයි.

1. කැලයේ සිත් ගත් තැන වූයේ කුමන ස්ථානය ද?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. රන් තණ පඳුරක් අස්සෙන් මතු වූයේ කුමක් ද?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. ගල් තලාවකින් ඇද හැලෙන දිය කඳ හඳුන්වන්නේ කුමන නමකින් ද?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. ගල් පර්වත රුසක හැපෙන දිය කඳ කුමන පැහැයෙන් යුතු ද?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. ගල්තලා දෙපස වැවී ඇත්තෙ මොනවා ද?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

6. ඡේදය කියවා පහත ප්‍රකාශ හරි නම් (v) ලකුණ ද, වැරදි නම් (x) ලකුණ ද යොදන්න.

1. කැලයේ සිත් ගත් තැන වූයේ ඊතණ පඳුර යි. ( )
2. රත්තණ පඳුර අස්සෙන් මතු වූයේ පුංචි දිය කඳුරකි. ( )
3. දිය කඳුර හෙමින් පහළට ගලා බසියි. ( )
4. දිය කඳ සැදෙන්නේ දිය කඳුරු එක් වීමෙනි. ( )
5. දිය කඳ ගල්තලාවකින් පහළට ඇද හැලේ. ( )

7. නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා යටින් ඉරක් අ!දින්න.

1. දිය ඇල්ල තිබුණේ . . . . . . . . . . . . . (ගමේය / කැලයේ ය.)
2. රත්තණ පඳුර අස්සෙන් මතු වූයේ . . . . . . . . . . . . (දිය ක!දුරකි. / දිය ඇල්ලකි.)
3. දිය කඳුරු කිහිපයක් එක් වී සැදෙන්නේ . . . . . . . . . . . . (දිය ඇල්ලකි / දිය කඳුරකි)
4. ගම මැදින් මතු වන්නේ . . . . . . . . . . . . . (දිය ඇල්ලකි / ඇළකි)
5. කැලෑවේ ටික දුරක් යන තෙක් පැතිරෙන්නේ . . . . . . . (ඇලෙහි / දිය ඇල්ලේ) සෝභාව යි.